# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** 011 7920950, 0117920951**Fax:** 011 7920949
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org


## පාර්ලිමේන්තු මැතිවරණය 2010

## මාධ්‍ය නිවේදනය 03

## 2010 මාර්තු 23 දින

## පැය 1800

ශ්‍රී ලංකාවේ කොළඹ දී. රාජ්‍ය දේපළ අයථා පරිදි මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම පිළිබඳව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත දිගින් දිගටම වාර්තා වෙමින් පවතී. මැ.ප්‍ර.නි.ම ට 2010 මාර්තු 22 දින වන විට වාර්තා වූ සමස්ත බරපතල සිද්ධි සංඛ්‍යාව 110 ක් වන අතර ඉන් සිද්ධි 32 ක් (29%) රාජ්‍ය දේපළ අයථා පරහරණය පිළිබඳව වේ.

**සිරස මාධ්‍ය ආයතනයට පහර දීම**

2010 මාර්තු 22 දින කොළඹ බ්‍රේබෲක් පෙදෙසේ පිහිටි සිරස ප්‍රධාන කාර්යාලයට පහර දීම මැ.ප්‍ර.නි.ම. තරයේ හෙලා දකිමු. මැ.ප්‍ර.නි.ම ට වාර්තා වී ඇති ආකාරයට ප්‍රහාරකයින් පැමිණ ඇත්තේ කැළණි බස් ඩිපෝවට අයත් අංක WP NA 6897 දරණ බස් රථයෙනි. මැ.ප්‍ර.නි.ම. මේ පිළිබඳව විමසීදීමේදී කොම්පඤ්ඤ වීදිය පොලිසියේ ස්ථානාධිපති අපරාධ පරීක්ෂක මලිත් පෙරේරා මහතා ප්‍රකාශ කර සිටියේ අත් අඩංගුවට ගත් පුද්ගලයින්ගේ ප්‍රකාශයන්ට අනුව ඔවුන්ගෙන් සමහරෙක් එ.ජ.නි.ස. අපේක්ෂක දුමින්ද සිල්වා (අංක 8) මහතාගේ සංගීත සංදර්ශනයට යමින් සිටි ආධාරකරුවන් බවයි. මේ පිළිබඳව දුමින්ද සිල්වාගෙන් විමසු විට ඔහුගේ ආධාරකරුවන් මෙම සිදුවීමට සම්බන්ධ නොමැති බව තරයේ ප්‍රකාශ කරන ලදී.

ප්‍රහාරය ඇති වීමට හේතු වූ පෙළඹවීම තහවුරු කරගත යුතුව ඇති අතරෙහි දවසේ පස්වරු භාගයක අගනගරය මධ්‍යයේ මෙලෙස ආයතනයකට පහර දීම කෙරෙහි මැ.ප්‍ර.නි.ම සිය අවධානය යොමු කරමින් සිටී. මෙම ප්‍රහාරය පැවැත්වීමට නියමිත මහ මැතිවරණයට ඇති කරන බලපෑම සම්බන්ධව සැලකීමේදී නිදහස් තොරතුරු ගලා යාම , තොරතුරු ලබා ගැනීමට ජනතාවට ඇති අයිතිය හා නීතියේ බලය කෙරෙහි ඉතා අහිතකරව බලපානු ඇත. ප්‍රහාරකයින්ට විරුද්ධව ක්‍ෂණිකව හා ඵලදායි පියවර බියෙන් හා පුද්ගල පක්ෂපාතීත්වයන්ගෙන් තොරව ගන්නා ලෙස මැ.ප්‍ර.නි.ම. පොලීසියෙන් ඉල්ලා සිටී.

**රාජ්‍ය දේපළ අයථා පරිහරණය පිළිබඳව නැවත නැවත ලැබුණු වාර්තා**

මාර්තු 23 වන දින පස්වරු 12.00 ට පමණ පාසල් ගුරුවරු සහ විදුහල්පතිවරු සඳහා රැස්වීමක් පොතුවිල් අෂ්රෆ් අතාවුල්ලා අනුස්මරණ ශාලාවේ පැවති බව මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක වාර්තා කර සිටී. මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂකට අනුව එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂ වන ඒ.එච්. අබ්දුල් බෂීර් (අංක 03) ඒ.එම්. ලෙබ්බේ ( අංක 05) සහ ඒ.එම්. අතාවුල්ලා (අංක 02) සහ නැගෙනහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන වාරිමාර්ග නිවාස හා ඉදිකිරීම් ග්‍රාමීය විදුබල හා ජල සම්පාදන අමාත්‍ය උදුමා ලෙබ්බේ යන අය මෙම රැස්වීම අමතා ඇත.

ගුරුවරුන්ට එම රැස්වීමට සහභාගි වීම සඳහා පොතුවිල් ප්‍රදේශයේ සියලු පාසල් 23 වන දින පෙ.ව. 10.30 ට වසා දැමූ බව මැ.ප්‍ර.නි.ම. ට වාර්තා විය.

මේ පිළිබඳව මැ.ප්‍ර.නි.ම. අක්කරෙයි පත්තු කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යක්ෂක මුතාලිෆ් මහතාගෙන් විමසූ විට 23 වන දින පාසල් වැසීමට අවසරයක් ලබා නොතිබූ බව ප්‍රකාශ කරන ලදී. ඔහු තව දුරටත් ප්‍රකාශ කළේ මෙම අවසරය නැගෙනහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දී ඇති බව දැන ගන්නට ලැබුණු බවයි.

මේ පිළිබඳව නැගෙනහිර පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වීරවර්ධන මහතාගෙන් විමසූ විට තමන් මෙවැනි සිදුවීමක් ළිබඳව නොදන්නා බවත් ඒ පිළිබඳව් පිළිබඳව තමන් සොයා බලන බව පැවසීය.

මන්නාරම නැවත පදිංචි කිරීම් සහ ආපදා සහන, දැනට සිටින අමාත්‍ය එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක රිෂාඩ් බදුයිදීන් (අංක 01) ගේ මන්නාරම මැතිවරණ ව්‍යාපාරය සඳහා ජාතික තරුණ සේවා සභාවේ ගොඩනැගිල්ල සහ සේවකයින් යොදා ගන්නා බවට මැ.ප්‍ර.නි.ම. ට 22 දින වාර්තා විය. රිෂාඩ් බදුයිදීන්ගේ ආධාරකරුවන් සහ සංවිධායකවරුන් සඳහා රැස්වීමක් 22 දින පැවති බවට වාර්තා විය. මේ චෝදනාව පිළිබඳව මැ.ප්‍ර.නි.ම. මන්නාරම තරුණ සේවා සභාවේ නිලධාරියෙකුගෙන් විමසූ විට එවැනි රැස්වීමක් පැවැත්වූ බවට ඇති චෝදනාව ප්‍රතික්ෂේප කරන ලදී.

රිෂාඩ් බදුයිදීන් මහතා සම්බන්ධ කර ගැනීමට දරූ උත්සාහය සාර්ථක නොවීය.

**යාපනය** - මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂකට අනුව එක්සත් ජනතා නිදහස් සන්ධාන යාපනය දිස්ත්‍රික් අපේක්ෂක ඇලෙක්සැන්ඩර් චාර්ල්ස් (අංක 04) 2010 මාර්තු 18 දින පස්වරු 1.30 ට පමණ කවායි රජයේ දෙමළ මිශ්‍ර විද්‍යාලයේදී රැස්වීමක් පවත්වා ඇත.

මේ පිළිබඳව ඇලෙක්සැන්ඩර් චාර්ල්ස් මහතාගෙන් විමසූ විට ඔහු එම චෝදනාව තරයේ ප්‍රතික්ෂේප කරන ලදී.

**නුවරඑළිය**- බලයේ සිටින තරුණ බල අභිවෘද්ධි හා සමාජ හා ආර්ථික සංවර්ධන අමාත්‍ය එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂ ආරුමුගම් රාමනාදන් තොන්ඩමන් (අංක 10) විසින් 2010 මාර්තු 17 දින පතාන විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේදී රැස්වවීමක් පවත්වා ඇත.

විදුහල්පතිවරු පස්දෙනෙකු සහ එම පාසලේ සේවය කරන පුහුණු වන ගුරුවරු මෙම රැස්වීමට සහභාගි වූ බව මැ.ප්‍ර.නි.ම. වාර්තා විය. ඔවුන්ගෙන් තිදෙනෙකු පිළිවෙලින් භාරතී මහා විද්‍යාලයේ , හයිලන්ඩ් මධ්‍ය විද්‍යාලයේ සහ කොටගල දෙමළ මහා විද්‍යාලයේ විදුහල්පතිවරු බව හඳුනාගෙන ඇත. කොටගල ප්‍රාදේශීය සභාවට අයත් අංක CPPA 5267 දරණ ලොරිය එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක ශාන්තිනී චන්ද්‍රසේකරන් ගේ(අංක 09) ප්‍රචාරක කටයුතු වලට යොදාගනිමින් සිටින බව මැ.ප්‍ර.නි.ම. වාර්තා වී ඇත. කොටගල ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු මෙම චෝදනාව ප්‍රතික්ෂේප කරන ලදී.

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 104 බී (4) (9) වගන්ති අනුව යමින් මහජන දේපළ අව භාවිතය තහනම් කරනු ලබන මැතිවරණ කොමසාරිස්වරයාගේ මාර්ගෝපදේශනය මැ.ප්‍ර.නි.ම. ඉතා අගය කර සිටී.එයට අනුව පැහැදිලිව

***"මැතිවරණය පැවැත්වෙන කාලය තුළ කුමන ආකාරයක හෝ රජයට හෝ වෙනත් රජයේ සමාගමකට අයත් චංචල හෝ නිශ්චල දේපළක් මැතිවරණ කටයුතු සඳහා භාවිතය තහනම් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට බලය ඇත."***

2010 මාර්තු 22 වන විට මැ.ප්‍ර.නි.ම. වාර්තා වූ සමස්ත සිද්ධි සංඛ්‍යාව 170 කි. ඉන් 110 ක් (64%) ක් බරපතල සිදුවීම් වේ. ගිනි අවි භාවිතා වූ සිදුවීම් 31 ක් (28%) ක් දක්වා ඉහළ ගොස් ඇත. බරපතල සිද්ධි 22ක් මධ්‍යම පළාතෙන්ද, 17 ක් වයඹ පළාතෙන්ද, 16ක් සබරගමු පළාතෙන්ද වාර්තා වී ඇත. බරපතල සිද්ධීන් 12ක් නැගෙනහිර පළාතෙන්ද 11ක් ඌව පළාතෙන්ද 9 ක් දකුණු පළාතෙන්ද 8 බැගින් බටහිර සහ උතුරු පළාත් වලින්ද සහ 7ක් උතුරු මැද පළාතෙන්ද වාර්තා වේ.

එක්සත් ජනතා නිදහස් සන්ධානයට විරුද්ධව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 127 ක් වන අතර ඉන් 25 ක් එම පක්ෂයේම ආධාරකරුවන් විසින් කරන ලද පැමිණිලි වේ. එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව පැමිණිලි 07ක් ද චූදිතයන් හඳුනානොගත් පැමිණිලි 35ක් ද ලැබී ඇත. ස්වාධීන කණ්ඩායමකට විරුද්ධව එක පැමිණිල්ලක් බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාත සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.



ආචාර්ය පී. සරවනමුත්තු

සම කැඳවුම්කරු



සුනිල් ජයසේකර

සම කැඳවුම්කරු



උදය කළුපතිරණ

සම කැඳවුම්කරු